9152-->	2.2-OtherMachinary&Equipment		61122	294,762,690.45	1,499,895.36	0.00	3,255,538.96	679,082.30	298,839,042.47
		OfficeEquipment	****61122013	6,792,304.21	500,167.20	0.00	1,696,557.20	186,670.00	38,802,358.61
		Computer Equipment	****61122021	28,385,198.19	289,100.00	0.00	650,330.00	271,900.00	129,052,728.19
		ElectricalEquipment	****61122037	437,328.77	228,040.00	0.00	129,300.00	0.00	7,794,668.77
		Communication Equipment	****61122047	781,796.92	25,560.00	0.00	230,830.00	21,060.00	8,017,126.92
		Furniture	****61122051	05,055,562.36	457,028.16	0.00	526,771.76	199,452.30	105,839,909.98
		MedicalEquipment	****61122077	3,275.00	0.00	0.00	8,000.00	0.00	81,275.00
		Sports equipment	****61122081	762,500.00	0.00	0.00	0.00	0.00	1,762,500.00
		Construction Eqipment	****61122132	3,625.00	0.00	0.00	13,750.00	0.00	37,375.00
		DefenceEquipment	****61122154	9,000.00	0.00	0.00	0.00	0.00	49,000.00
		Agricultural &Dairy FarmEquipment	****61122167	402,100.00	0.00	0.00	0.00	0.00	7,402,100.00
9153-->	4.1-Land		61410	760,425,742.00	1,441,595,000.00	0.00		230,000.00	2,201,790,742.0
		Land	****614100	760,425,742.00	1,441,595,000.00	0.00		230,000.00	2,201,790,742.0

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය:- 272 **අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :-දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල**

වෙනත් ආයතන විසින් ,වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම්	8,139,582,531	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී "ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම්	48,463,839	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	8,914,532	
පොදු තැන්පත් වියදම් (වෙනත් දෙපාර්තමේන්තු)	1,263,014	8,198,223,916
අඩු කළා:		
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්,වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම්	514,478,045	
වෙනත් ආයතන විසින්,වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම්	347,100	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන්,වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම්	75,726,636	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් " බී" ගිණුමට කරන ලද හර කිරීම්	370,167	
පොදු තැන්පත් ලැබීම් (වෙනත් දෙපාර්තමේන්තු)	1,263,463	
		592,185,411
2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය		**7,606,038,505**

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කල හැක.

B.G.B.S. JAYAS... 2022/02/21
Chief Accountant
District Secretariat
Kurunegala.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (රු.000)

ආදායම් සංකේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතුකරනලද ආදායම	
		මුල් ආදායම්ඇස්තමේන්තුව	අවසන් ආදායම්ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසන්ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
10.02.04.01	සුරාබද්ද - මත්පැන්			-	
10.02.07.00	මුද්දර ගාස්තු			746.5	
10.03.07.02	රෙජිස් ට්‍රාර්ජනරාල් දෙපාර්තමේන්තුවට අදාල ලියාපදිංචිකිරීමේ ගාස්තු			52081.7	
10.03.07.03	පෞද්ගලික දැව ප්‍රවාහනය			2153.7	
10.03.07.04	මොටර්ර ථවිකිණීම මත බදු			18	
10.03.07.05	මහජන ආරක්ෂකඅමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු			1598.5	
10.03.07.09	කාබන් බද්ද			27968.9	
10.03.07.99	අනෙකුත් බලපත්‍ර ගාස්තු			22606.8	
20.02.01.01	රජයේ ගොඩනැගිලි කුලී			2402.2	
20.02.01.02	රජයේ කැලෑවලින් ලැබෙන ආදායම්			3817.2	
20.02.01.03	ඉඩම් හා අනෙකුත් බදුකුලී			3660.6	
20.02.01.99	අනෙකුත් කුලී			-	
20.02.02.01	ණය දීම			-	
20.02.02.99	පොලිය වෙනත්			18429.6	
20.03.01.00	දෙපාර්තමේන්තුමය විකිනීම්			-	
20.03.02.06	සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ පනත යටතේ ගාස්තු			-	
20.03.02.07	වීසා බලපත්‍ර,විදේශ ගමන් බලපත්‍ර පුරවැසිභාවය ලබාගැනීම පිළිබඳ ගාස්තු			-	
20.03.02.13	විභාග හා අනිකුත් ගාස්තු			422.0	
20.03.02.14	මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ ගාස්තු			186539.6	
20.03.02.03	හැදුනුම්පත් ගාස්තු			12529.8	
20.03.02.99	විවිධ			3701.5	
20.03.03.00	දඩ මුදල් හා රාජසන්තක කිරීම			-	
20.03.03.02	දඩ මුදල් හා රාජසන්තක කිරීම			66.3	
20.03.99.00	අනෙකුත්ලැබීම් (රජයේආදායම් - විවිධ)			20688.3	
20.04.01.00	වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප් දායක අරමුදල			148569.1	
20.05.99.00	අනෙකුත් පැවරීම්			-	
20.06.02.00	ප්‍රාග්ධන වත්කම් විකිනීම			-	
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිනීම			5935.0	
20.03.04.00	රජයේ නිලධාරීන්ට යතුරුපැදි ලබාදීම			-	
2003.07.00	කෘෂිකර්ම			1506.8	
				515442.1	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු(000)

	වෙන්කරනලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන/අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ %ලෙස
ප්‍රතිපාදන වර්ගය	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,090,800	3,009,846	2,922,897	97
ප්‍රාග්ධන	66,200	166,200	48,990	29
	2,157,000	**3,176,046**	**2,971,887**	93

3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන

රු(000)

අ. අ	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදනය			උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන , ලබාදුන් අවසන් ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය	තත්‍ය වියදම	
1	බුද්ධ ශාසන ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	සමාජ සංස්කෘතික ඒකාබද්ධතා සංවර්ධන වැඩසටහන	14,887.00	14,887.00	9692.85	65.11
		ආගමික කටයුතු නඟා සිටුවීමේවැඩසටහන	42,369.50	42,369.50	40075.59	94.59
2	අධිකරණ අමාත්‍යාංශය	සමථ මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන	22,059.11	22,059.11	19068.20	86.44
		පරිපාලන හා ආයතනික කටයුතු	3,825.00	3,825.00	3214.52	84.04
		ජාතික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.	12,838.16	12,838.16	12163.58	94.75
3	සෞඛ්‍ය අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා වැඩසටහන	930,463.00	930,463.00	918274.60	98.69
		බෝවන සහ බෝ නොවන රෝග පාලන වැඩසටහන	7,481.00	7,481.00	7249.45	96.90
4	ප්‍රවාහන අමාත්‍යාංශය	නවදුම්රිය මාර්ග සංවර්ධන වැඩසටහන	1,678.10	1,678.10	1671.81	99.63
5	වෙළඳ අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා වැඩසටහන	16,138.52	16,138.52	15434.35	95.64
6	මහාමාර්ග අමාත්‍යාංශය	මහා මාර්ග සංවර්ධන වැඩසටහන	20.00	20.00	20.00	100.00
7	කෘෂිකර්ම අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා වැඩසටහන	48,739.21	48,739.21	45756.58	93.88
		කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන	199.78	199.78	166.53	83.36
8	ඉඩම් අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා වැඩසටහන	20,302.22	20,302.22	19389.66	95.51
		ඉඩම් සංවර්ධනයසහ ඉඩම් අත් පත් කර ගැනීමේ වැඩසටහන	45,933.02	45,933.02	45933.02	100.00
9	රාජ්‍යසේවා පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා(රාජ්‍ය භාෂා) වැඩසටහන	471.92	471.92	464.73	98.48
		පරිපාලන හා ආයතනික සේවා(රාජ්‍ය පරිපාලන) වැඩසටහන	1,293,191.16	1,293,191.16	1229106.13	95.04
10	පරිසර අමාත්‍යාංශය	පරිපාලන සේවා ආයතනික සේවා වැඩසටහන	15,545.88	15,545.88	15003.47	96.51
		පරිසර සංරක්ෂන වැඩසටහන	4,773.35	4,773.35	3133.49	65.65
11	තාක්ෂණ අමාත්‍යාංශය	තාක්ෂණ සංවර්ධන වැඩසටහන	4,737.39	4,737.39	3327.98	70.25
12	ජාතික ඵලදායිතාකාර්යාලය	ජාතික ඵලදායිතා මෙහෙයුම් වැඩ සටහන	1,215.00	1,215.00	932.38	76.74
13	තරුණහා ක්‍රීඩා අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා වැඩසටහන	163.00	163.00	98.91	60.68
		ස්මාට් ශ්‍රී ලංකා වැඩසටහන	990.50	990.50	865.86	87.42
		ක්‍රීඩා සංවර්ධන වැඩසටහන	45,000.00	45,000.00	43428.86	96.51

		තරුණ සංවර්ධන වැඩසටහන	4,150.24	4,150.24	2867.23	69.09
14	වාරි මාර්ගඅමාත්‍යාංශය	වාරි මාර්ග සංවර්ධන වැඩසටහන	5,256.25	5,256.25	3350.25	63.74
15	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	සාමාන්‍යප රිපාලන වැඩ සටහන	830.48	830.48	272.27	32.79
		බෞද්ධ ආගමිකකටයුතු ප්‍රවර්ධන වැඩසටහන	69,679.51	69,679.51	65984.69	94.70
16	මුස්ලීම් ආගමිකහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	මුස්ලීම් ආගමිකහා සංස්කෘතික කටයුතු වර්ධනය කිරීමේ වැඩසටහන	773.52	773.52	753.07	97.36
17	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	ක්‍රිස්තියානි ආගමික හා සංස්කෘතික කටයුතු වර්ධනය කිරීමේ වැඩසටහන	6,983.51	6,983.51	1711.52	24.51
18	සංස්කෘතික දෙපාර්තමේන්තුව	ප්‍රකාශන හා සාහිත්‍ය කටයුතු වැඩ සටහන	180.60	180.60	180.60	100.00
			1,500.00	1,500.00	1310.65	87.38
		කලාහා කලා ශිල්ප වර්ධන වැඩ සටහන	6,570.00	6,570.00	6141.36	93.48
19	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	ප්‍රවෘත්තිප්‍රචාරණ වැඩ සටහන	213.28	213.28	163.79	76.80
20	සමාජ සේවා දෙපාර්තමේන්තුව	පරිපාලන හා ආයතනික සේවා වැඩසටහන	8.20	8.20	4.60	56.10
		සමාජ සේවාවන් සඳහා මුදල් ආධාර වැඩසටහන	33,585.52	33,585.52	32473.85	96.69
		සමාජසේවා සංවර්ධන වැඩසටහන	3,325.06	3,325.06	2940.24	88.43
21	පරිවාස භාළමාරක්ෂණ දෙපාර්තමේන්තුව	පරිවාස භාළමාරක්ෂණ සංවර්ධන වැඩසටහන	5,592.93	5,592.93	5534.31	98.95
22	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ක්‍රීඩා සංවර්ධන වැඩසටහන	1,405.75	1,405.75	1213.97	86.36
23	ආයර්වේද දෙපාර්තමේන්තුව	ඖෂධ පැලෑටි සංරක්ෂන වැඩසටහන	899.02	899.02	0.00	0.00
24	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ වැඩසටහන	35,299.49	35,299.49	34977.04	99.09
25	අධිකරණ අමාත්‍යාංශය	අධිකරණ පරිපාලන වැඩසටහන	6,611.51	6,611.51	0.00	0.00
26	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව	ප්‍රතිපත්ති සංවර්ධන වැඩසටහන	177,720.00	177,720.00	112463.40	63.28
		ග්‍රාමීය සංවර්ධන වැඩසටහන	935,468.51	935,468.51	917500.18	98.08
27	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	සුරාබදු ආඥා පනත හා දුම්කොල බදු පරිපාලනය සහ මත් පැන් කර්මාන්තය නියාමනය කිරීමේ වැඩසටහන	1,468.92	1,468.92	0.00	0.00
28	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	තක්සේරුසේවා වැඩසටහන	3,141.23	3,141.23	2440.00	77.68
29	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම වැටුප්ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන	705,074.02	705,074.02	637199.14	90.37
30	රෙජිස්ට්‍රාර් ජනරාල්දෙපාර්තමේන්තුව	සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා වැඩසටහන	244.65	244.65	0.00	0.00
		ලියාපදිංචි කිරීමේ වැඩසටහන	2,016.06	2,016.06	1939.35	96.20
31	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා වැඩසටහන	12,016.00	12,016.00	11964.14	99.57
32	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	අන්තර් පළාත් ඉඩම් සංවර්ධන වැඩසටහන	2,232.26	2,232.26	2232.26	100.00
33	අපනයන කෘෂිකර්මදෙපාර්තමේන්තුව	අපනයන බෝග සංවර්ධන වැඩසටහන	300.00	300.00	266.04	88.68
34	මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	මෝටර්රථ ප්‍රවාහන පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන	4,563.73	4,563.73	2439.20	53.45

35	ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව	පරිපාලනය හා ආයතනික සේවා වැඩසටහන	45.00	45.00	43.46	96.57
36	ඉඩම්පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	ඉඩම්පරිහරණ සැලසුම් හා ඉඩම් සංවර්ධන වැඩසටහන	8,205.70	8,205.70	7189.47	87.62
37	මිනිස් බල හාරැකීරක්ෂා දෙපාර්තමේන්තුව	පරිපාලන හා මිනිස් බල,රැකී රක්ෂා සංවර්ධනවැඩසටහන	2,278.55	2,278.55	1991.20	87.39
38	බහු කාර්යයසංවර්ධන කාර්යසාධක බලකාදෙපාර්තමේන්තුව	සාමාන්‍යපරිපාලනය හා ආයතනික සේවා වැඩසටහන	906,491.34	906,491.34	888256.29	97.99
39	ජාතිකඋරුම,ප්‍රසාංග කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	ජාතිකඋරුම,ප්‍රසාංග කලා සහ ජන කලා ප්‍රවර්ධන වැඩසටහන	269.46	269.46	242.51	90.00
40	ග්‍රාමීය පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	පරිපාලන හා ආයතන සේවා වැඩසටහන	7,908.74	7,908.74	4260.05	53.87
41	කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	කාන්තා සංවර්ධන වැඩසටහන	9,684.81	9,684.81	8860.42	91.49
		ළමා සංවර්ධන වැඩසටහන	509,785.86	509,785.86	501091.97	98.29
		සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන	96,024.09	96,024.09	36075.81	37.57
42	පසුගාමීග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සතත්ව පාලන හා සුළු ආර්ථික බෝග වගාප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	පසුගාමීග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සතත්ව පාලන හා සුළු ආර්ථික බෝග වගාප්‍රවර්ධන වැඩසටහන	2,998.56	2,998.56	2990.45	99.73
43	වේවැල්පිත්තල මැටි ලීබඩු සහ සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	කාර්මික සංවර්ධන වැඩසටහන	120,647.48	120,647.48	86465.04	71.67
44	අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍යඅමාත්‍යාංශය	පරිපාලන හා ආයතන සේවා(අභ්‍යන්තර කටයුතු) වැඩසටහන	1,280.63	1,280.63	1226.00	95.73
		ස්වදේශ කටයුතු වැඩසටහන	13,161.52	13,161.52	9670.03	73.47
		ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන වැඩසටහන	1,101,365.26	1,101,365.26	1099798.22	99.86
		පරිපාලන හා ආයතනසේවා (ආපදා කලමනාකරණ) වැඩසටහන	512.16	512.16	179.04	34.96
		ආපදා සහන මෙහෙයුම් වැඩසටහන	91,143.00	91,143.00	81395.88	89.31
		ස්වදේශ කටයුතු වැඩසටහන	500.00	500.00	436.29	87.26
		ආපදාඅවම කිරීමේ ව්‍යාපෘතිය වැඩසටහන	50.44	50.44	50.44	100.00
45	විදේශරැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය	පරිපාලනහා ආයතන සේවා වැඩසටහන	61,929.76	61,929.76	57186.45	92.34
46	සමෘද්ධි ගෘහ ආර්ථිකක්ෂද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ගම්මාන සවි බලගැන්වීම සහ ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීමේ වැඩසටහන	1,074,927.13	1,074,927.13	467457.69	43.49
		සමාජ සංවර්ධන වැඩසටහන සම්බන්ධීකරනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන	565,707.69	565,707.69	562635.71	99.46
47	ග්‍රාමීය නිවාසහා ඉදිකිරීම් ගොඩනැඟිලි ද්‍රව්‍ය කර්මාන්තරාජ්‍ය අමාත්‍යාංශය	ඉදිකිරීම් කර්මාන්තය සංවර්ධනය කිරීම,නිවාස අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම සහ නැවත පදිංචිකිරීමේ වැඩසටහන	312.80	312.80	312.80	100.00

48	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	පරිපාලනහා ආයතන සේවා වැඩසටහන	16,193.86	16,193.86	15975.01	98.65
49	නිපුණතා සංවර්ධනවෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපයුම් රාජ්‍ය අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනසේවා වැඩසටහන	1,434.82	1,434.82	938.28	65.39
		වෘත්තීය පුහුණුහා නිපුනතා සංවර්ධන වැඩසටහන	2,667.60	2,667.60	1416.30	53.09
50	දහම් පාසැල් පිරිවෙන් භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාතයාංශය	පරිපාලන හා ආයතනසේවා වැඩසටහන	799.92	799.92	794.92	99.37
		පිරිවෙන් අධ්‍යාපනය සවිමත් කිරීමේ වැඩසටහන	4,045.33	4,045.33	3863.74	95.51
51	වී හා ධාන්‍ය,කාබනික ආහාර, එළවළු,පලතුරු,මිරිස්,ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය,බීජ නිෂ්පාදනය හා උසස්තා ක්ෂන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	පරිපාලන හා ආයතන සේවා වැඩසටහන	5,642.48	5,642.48	5642.48	100.00
		අහාර බෝග වගාකිරීම සහ ප්‍රවර්ධනය සහ කෘෂිකාර්මික තාක්ෂනය උත්පාදන වැඩසටහන	130.00	130.00	0.00	0.00
52	පොහොරනිෂ්පාදන හා සැපයුම් රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය	පරිපාලනහා ආයතන සේවා වැඩසටහන	306.36	306.36	184.53	60.23
53	ඉඩම් කලමනාකරණකටයුතු,රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ඉඩම් සංවර්ධනයසහ කලමනාකරණ වැඩසටහන	260.40	260.40	211.55	81.24
54	උක්බඩඉරිගු කජු ගම්මිරිස් කරුදු කරාබු නැටි බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගාසංවර්ධන ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	කුඩා වැවිලි බෝග ආශ්‍රිත අංශ සංවර්ධන වැඩසටහන	6,621.42	6,621.42	4724.17	71.35
55	ග්‍රාමීයහා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සැපයුම සංවර්ධනය කිරීමේ වැඩසටහන	783.60	783.60	733.60	93.62
56	ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන	461,350.00	461,350.00	4183.49	0.91
57	බතික්අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	කාර්මික සංවර්ධන වැඩසටහන වැඩසටහන	303.55	303.55	303.55	100.00

3.8මූල්‍ය නොවන වාර්තා කිරීමේ කාර්ය සාධනය **(රු.000)**

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		1,655,425		
9152	යන්ත්‍රෝපකරණ හා වාහන		597,193		
9153	ඉඩම්		2,201,790		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙනලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. KRG/A/DSK/ACC/2021/53
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2022 මැයි 30 දින.

ගණන්දීමේ නිලධාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කුරුණෑගල.

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 272-1-1-6-1205 හා 272-1-1-7-2509 යන වෙනත් වැය විෂයයන් සඳහා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, පිළිවෙලින් රු.65,000,000 ක් හා රු.100,000,000 ක් වශයෙන් පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මෙම වැය විෂයයන් දෙක සඳහා ලබාගෙන තිබුණ අතර, එයින් වර්ෂය තුළ වියදම් දැරූ පසු රු.63,591,862 ක් හා රු.94,565,000 ක් ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 23 ක ප්‍රතිපාදනවලින් වර්ෂයේ වියදම් දැරීමෙන් පසුව රු.26,983,000 ක ඉතිරිවීම් වෙනත් වැය විෂයයන්ගේ අතිරික්ත වියදම් පියවීම සඳහා මාරුකිරීම් හේතුවෙන් මාර්ගෝපදේශ අංක 06 යටතේ වූ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2021/03 හි 3.4 ඡේදය ප්‍රකාරව ඉතිරිවීම් සඳහා හේතු දැක්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වී තිබුණි.

(ඇ) වැය විෂයයන් 11 ක් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා රු.200,000 සිට රු.10,237,000 ක් දක්වා එනම් සියයට 1 සිට සියයට 218 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩිකර ගැනීමෙන් පසු වියදම් දරා තිබුණි.

(ඈ) වැය විෂයයන් 08 ක් සඳහා වැඩිකර ගෙන තිබූ ප්‍රතිපාදනවලින් සියයට 4 සිට සියයට 81 දක්වා පරාසයක් තුළ එනම් රු.132,776 සිට රු.1,101,757 ක ප්‍රමාණයක් ඉතිරි කිරීම හේතුවෙන් ඌණ උපයෝජනය කර තිබුණි.

(ඉ) වැය විෂයය අංක 272-1-2-1001 හා 272-1-2-1002 සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු.617,000 ක් හා රු.773,000 ක් වැඩිකරගෙන තිබුණ අතර, එම වැය විෂයයන් දෙකෙහි ඉතිරිය පිළිවෙලින් රු.1,699,600 ක් හා රු.1,962,214 ක්ව පැවතුණ බැවින්, එම ඉතිරිය වැඩිකළ ප්‍රතිපාදනයෙන් සියයට 275 ක් හා 254 ක් වූයෙන් කිසිදු අවශ්‍යතාවයකින් තොරව ප්‍රතිපාදන මාරුකරගෙන තිබූ බව නිරීක්ෂණය විය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් ඉරගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 104(3) සහ 104(4)	අනතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේනම් ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. තවද, පූර්ණ වාර්තාව අලාභහානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාල වාහන 08 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම මෙම වාහන තුනකට අදාලව රු.168,739 ක අලාභයක් අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 137(i) හා (v) 215 (i) හා (iii) 237	සැපයුම් ලැබී නොතිබියදී එකතුව රු.2,485,911 ක් වූ චෙක්පත් 22 ක් ආදායකයින් වෙත නිකුත් නොකර දින 35 සිට 43 දක්වා කාලයක් අත රඳවාගෙන තිබුණි.
(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
(i). 1993 ජනවාරි 13 දිනැති දිස්ත්‍රික් ලේකම්රුවන් ඇමතූ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය (ii). 2006 මාර්තු 21 දිනැති අංක HA/DA/12/27 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය	සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් තම නිල නිවසෙහි පදිංචි විය යුතු වුවද, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති පදිංචියට සුදුසු තත්ත්වයේ පවතින නිල නිවසෙහි ප්‍රාදේශීය ලේකම් පදිංචි වී නොතිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

(i) මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2021 ජනවාරි 11 දිනැතිව නිකුත් කළ අංක.MF/NPD/01/2021 දරන චක්‍රලේඛය හා 2021 පෙබරවාරි 10 දිනැති අංක.MF/NPD/01/2021(i) දරන චක්‍රලේඛය	අපේක්ෂිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් ප්‍රජා මූල සංවිධාන සඳහා මුළු විමධ්‍යගත ප්‍රතිපාදන වියදමෙන් සියයට 41 ක් ලබාදී තිබූ අතර, චක්‍රලේඛයෙන්හි දක්වා ඇති ක්ෂේත්‍ර 13 ම ආවරණය වන ලෙස ප්‍රතිපාදනයන් වෙන්කර නොතිබුණි.
(ii) 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක.MFNDP/01/2021 දරන චක්‍රලේඛයේ 2 ඡේදය	පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සම්පූර්ණ ප්‍රතිපාදන රු.මිලියන 05 කින් සියයට 50 ක අවමයක් භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්) සඳහා වෙන් නොකර පඬුවස්නුවර (බටහිර), බමුණාකොටුව සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දහම් පාසල් හා පන්සල් සංවර්ධනය සහ ලියාපදිංචි සමිති සඳහා භාණ්ඩ බෙදාදීම් වෙනුවෙන් රු.10,806,441 ක් එනම් සියයට 72 ක් වැයකර තිබුණි.
(iii) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2021 ජනවාරි 11 දිනැති සහ අංක.MF/NDP/01/2021 දරන මුදල් චක්‍රලේඛයේ 2.4 ඡේදය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජනගහන දරිද්‍රතාවය සහ භූමි ප්‍රමාණය යන සාධක පදනම් කරගෙන විමධ්‍යගත මන්ත්‍රී ප්‍රතිපාදන බෙදී යන පරිදි ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක නොකර 2021 වර්ෂය තුළදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක සමිති 37 කට අවස්ථා 80 කදී සහ 2019 වර්ෂය සමඟ සැසඳීමේදී සමිති 27 කට අවස්ථා 27 කදී රු.2,277,068 ක් වටිනා භාණ්ඩ එකම සමිතිවලට ලබාදී තිබුණි.

(ඇ) වෙනත් වක්‍රලේඛ

(i). බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ MDTF/Trg/mgt/03(i) ඡේදය හා 2020 නොවැම්බර් 25 දිනැති ලිපියේ අංක 03 (අ) ඡේදය	කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවම අධ්‍යාපන මට්ටම වන 8 ශ්‍රේණිය සපුරා නොමැති අයදුම්කරුවන් 3 දෙනෙකු හා අදාල සුදුසුකම්වලට ඉහළ සුදුසුකම් වන අ.පො.ස.(සා.පෙළ) සමත් අයදුම්කරුවන් 11 දෙනෙකු වක්‍රලේඛයේ විධිවිධානවලින් බැහැරව බහුකාර්ය සංවර්ධන පුහුණුලාභීන් ලෙස බඳවාගෙන තිබුණි.
(ii). සමෘද්ධි මාර්ගෝපදේශ සංග්‍රහය 2021/1	ව්‍යාපාති ක්‍රියාත්මක කිරීම ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට පැවරෙන බැවින් ප්‍රතිලාභීන් සම්බන්ධ සියලු තොරතුරු ඔවුන් සතු ක්ෂේත්‍ර පොතේ සටහන් කර අවශ්‍ය වේලාවේදී විගණනයට ලබාදීමට ක්‍රියාකළ යුතු අතර, එහි එක් එක් දිනවලදී ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය වර්ධනයවීමට අදාල සටහන් පවත්වාගෙන යා යුතු වුවද එසේ කර නොතිබුණි.
(iii). ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2018 මාර්තු දිනැති අංක 01/2018 දරන වක්‍රලේඛය	ග්‍රාම නිලධාරීන් විසින් තම ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් දෙසති වාර්තා මඟින් ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් ග්‍රාම නිලධාරීන් විසින් ඒ සම්බන්ධ වාර්තා ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලබාදී නොතිබුණ අතර, එවැනි ඉදිකිරීම් නොමැති අවස්ථාවල හිස් වාර්තා ලබාදීමටද කටයුතු කර නොතිබුණි.

2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරකට අදාලව මිය ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට වන විට රු.396,674 ක ණය ශේෂයන් අයවිය යුතුව පැවති අතර, රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරිණියකගේ ණය ශේෂය වන රු.211,131 ක් වර්ෂ 17 මාස 07 ක කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.415,603 ක මුදලක් අයකර ගත යුතු අතර, මෙයින් රු.321,436 ක මුදලක් වර්ෂ 05 සිට වර්ෂ 20 මාස 06 ක පමණ කාලයක් තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක ගිණුම් අංක 6000-0-0-16-0-42 යටතේ වූ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.80,396,403 ක් වර්ෂ 02 සිට 05 දක්වා කාලයක් නිදහස් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ගිණුම් අංක 6000-0-0-13-0-60 යටතේ තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු යටතේ රු.2,401,911 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, උඩුබද්දාව, බමුණාකොටුව, රස්නායකපුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිරවුල් කිරීමට කටයුතු නොකර අවුරුදු 02 සිට 05 දක්වා කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) රජයට ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ලැබුණු රු.99,808,968 ක මුදලක් වර්ෂ 05 කට අධික කාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් ගිණුම් අංක 6000-0-0-17-0-13 යටතේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබීමෙන් ඉඩම්වල හුක්තිය හාරගෙන වන්දි ගෙවීම ප්‍රමාද වී තිබුණි.

2.5 අමාත්‍ය මණ්ඩල තීරණවලින් බැහැරවීම

2021 පෙබරවාරි 09 දින අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණ අංක. අමාත්‍ය/21/01/14/304/011 ට අනුව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 පෙබරවාරි 10 දිනැති අංක.SMS/SDB/2021/general දරන 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම අනුව ග්‍රාම ශක්ති ව්‍යාපාරය වෙනුවෙන් 2017/2018/2019 වර්ෂවල 1 සහ 2 අදියර වශයෙන් ලැබුණු රු.241,522,755 ක ප්‍රතිපාදනවලින් 2021 වර්ෂය අවසානයට ඉතිරිවූ රු.77,762,470 ක මුදල් සෞභාග්‍යා ජාතික ගම්මාන සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා දායක කරගත යුතු වුවත්, එසේ කර නොතිබුණි. 2021 වර්ෂයේදී ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ සියලු කටයුතු සෞභාග්‍යා ජාතික ගම්මාන සවිබල ගැන්වීමේ වැඩසටහන සමඟ ඒකාබද්ධ කළ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නැංවිය යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 තුළ ග්‍රාම ශක්ති ජනතා සමිති 365 ක් ලියාපදිංචි කර තිබුණද, ඒවා නොසලකා 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල නැවත සමිති ලියාපදිංචි කර තිබුණ අතර, ඉහත සමිති සහ ඒ තුළ පැවති මුදල් ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

ප්‍රධාන අරමුණු අතර ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම ඇතුළත්ව තිබුණද, 2021 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාලව ගිනි අවි 726 ක වාර්ෂික බලපත්‍ර අලුත් කර නොතිබුණි.

3.1.2 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, චක්‍රලේඛයේ 03 ඡේදයේ (ආ) පරිදි අදාල වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්මක් (Activity Plan) හා ඒවා ක්‍රියාත්මක කාල රාමුව (Time line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Out put/ Out come) දක්වා නොතිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා රු.116,514,500 ක මුදලින් ව්‍යාපෘති 101 ක් ක්‍රියාවට නැංවීම සැලැසුම් කර තිබුණද, වර්ෂය අවසානයේ රු.17,668,592 ක් වටිනා ව්‍යාපෘති 15 ක් පමණක් නිමකර තිබුණ අතර, අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් රු.2,108,552 ක් වැයකර 2015 වර්ෂයේදී නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිඹිරියාව, වඳුරුස්ස ග්‍රාමයෙහි ඉදිකර තිබූ පානීය ජල ළිඳෙහි ජලය බීමට නුසුදුසු බව 2021 නොවැම්බර් 22 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, මෙම ප්‍රදේශයේ පදිංචි පවුල් 20 ක ජල අවශ්‍යතාවය සපුරාලීමට නොහැකි බැවින් ළිඳ ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුව නොතිබුණි.

(ආ) පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.2,109,616 වියදමින් ඉදිකළ කෝන්ගහමුල මීගස්පිටිය මාර්ගය වෙනත් කිසිදු මාර්ගයකට සම්බන්ධ නොවී පෞද්ගලික ඉඩමකින් අවසන් වී තිබූ අතර, මාර්ගයේ මුළු වටිනාකමින් රු.435,987 ක් වැයකර ඉදිකර තිබූ දකුණු පස කාණුව දැඩි අනාරක්ෂිත තත්ත්වයේ පැවතුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක වර්ෂය තුළ ක්‍රියාවට නංවන ලද සහිරිගමක් සංවර්ධන වැඩසටහන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ මුළු ව්‍යාපෘති 1,159 ක් සඳහා වැයකළ මුදල රු.905,975,386 ක් වූ අතර, ඉන් රු.802,594,963 ක් හෙවත් සියයට 89 ක් වැයකර තිබුණේ මාර්ග ඉදිකිරීම් ඇතුළත් වූ ක්ෂේත්‍රයට පමණක් වූ බැවින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 06 දිනැති හා අංක 01/2019 චක්‍රලේඛයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ග්‍රාමීය සංවර්ධනය තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කර කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවලට යාමට රු.2,183,200 ක් වැයකර ඉදිකර තිබූ මාර්ග 02 ක් කිසිදු සෞභාග්‍යා ගම්මානයකට යොමු නොවූ මාර්ග 02 ක් බවත් එකී අරමුණට පටහැනිව ඉදිකළ ව්‍යාපෘතීන් බවත් නිරීක්ෂණය විය.

(ඉ) ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන -2018 යටතේ කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලහිටියාව ග්‍රාම නිලධාරී වසමේ සැන්ටිපෝට් වත්ත ක්‍රීඩාංගනය ඉදිරිකිරීම සඳහා රු.1,936,188 ක මුදලක් ගෙවා තිබුණ අතර, ක්‍රීඩාපිටිය වල් බිහිවී භාවිතයට ගැනීමට නුසුදුසු තත්ත්වයක පැවතුණි.

(ඊ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුපොත පොලිසිය පිහිටි ස්ථානයේ කළුගල් සහිත ඉඩමක ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා තෝරාගෙන මූලික කාර්යය වන පස් පිරවීමෙන් සියයට 41 ක් සිදුකර ඉඩම වටා දැල් ගසා එම කාර්යයන් වෙනුවෙන් රු.1,470,000 ක මුදලක් වැය කර තිබුණ අතර, පස් පුරවා නොනිබීම හේතුවෙන් හා මෙම ස්ථානයට මීටර් 500 ක් නුදුරින් තවත් පහසුකම් සහිත ක්‍රීඩාංගනයක් තිබීම හේතුවෙන් මෙම ක්‍රීඩාංගනය නිෂ්කාර්යව පැවතුණි.

(උ) කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2021 ඔක්තෝබර් 01 දින රු.100,000,000 ප්‍රතිපාදනයන් ලබාදී තිබුණද, වර්ෂය අවසාන වන විට ඉන් රු.5,404,000 ක් වැයකර කැබලි කිරීමේ යන්ත්‍ර 20 ක් (මල්ටි වොපර්) ලබාගෙන තිබුණද, විගණන දිනය වූ 2022 අප්‍රේල් මස 06 දින වන විට අදාල යන්ත්‍ර ලැබීම පමණක් සිදුව තිබුණද, එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබාගෙන නොතිබුණි. රු.94,596,000 කම ප්‍රතිපාදන නැවත හරවා යවා තිබුණි.

(ඌ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් මඟින් සිදුකළ ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් රු.11,185,891 ක මුදලක් වැයකර තිබුණද, ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු අතර, මෙයින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොතිබුණි.

3.1.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 වර්ෂයේ සපිරි ගමක් ව්‍යාපෘතිය යටතේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 05 ක ජල නල පද්ධති සඳහා 2020 දෙසැම්බර් 29 දින රු.5,424,036 ක මුදලක් ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත ගෙවීම් කර තිබුණද, ව්‍යාපෘතිය විගණන දින වූ 2022 දෙසැම්බර් 29 දින දක්වා නිම කර නොතිබුණි.

(ආ) කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාම නිලධාරී වසම් 03 ක් සඳහා ග්‍රාමීය කමිටු විසින් හඳුනාගෙන ක්‍රියාවට නැංවිය යුතු රු.3,000,000 ක් වටිනා ජලනල එළීමේ ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබුණි.

3.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම වෙනුවෙන් උදු හා මුං භෝග වගා ව්‍යාපෘතියක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් අනුව අපේක්ෂිත මුළු උදු හා මුං අස්වැන්න වන කිලෝග්‍රෑම් 256,200 කින් ලැබී තිබුණේ කිලෝග්‍රෑම් 52,873 ක් හෙවත් සියයට 20 ක පමණ අඩු අස්වැන්නක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබූ රු.2,938,555 ක ප්‍රතිපාදනයෙන් රු.2,644,700 ක් පමණ වන සියයට 90 ක මුදලක් නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි.

(ආ) රාජ්‍ය ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020/2021 මහ කන්නයේ වී මිලදී ගැනීම සඳහා රු.50,000,000 ක් 2021 පෙබරවාරි 16 කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වෙත ලබාදී තිබූ අතර, එයින් රු.1,408,137 ක මුදලක් පමණක් එම කාර්යය සඳහා යොදවාගෙන රු.48,591,862 ක් එනම් මුළු මුදලෙන් සියයට 97 ක් ප්‍රයෝජනයට නොගෙන 2021 ජූනි 07 දින නැවත භාණ්ඩාගාරය වෙත ලබාදී තිබුණි.

(ඇ) ඉහත (ආ) හි සඳහන් වැඩසටහන යටතේ 2020/2021 මහ කන්නය සඳහා වී මිලදී ගැනීමට ගනේවත්ත, මහව, ගල්ගමුව, හා රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට 2021 පෙබරවාරි 23 දින රු.1,400,000 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාදී තිබුණද, එම කාර්යාල මඟින් කිසිදු මිලදී ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඈ) වී මිලදී ගැනීම සඳහා නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.4,000,000 ක් ලබාදී තිබුණු අතර, එයින් රු.44 බැඟින් වී මෙ.ටො.29,366 ක් මිලදී ගැනීම සඳහා රු.1,408,137 ක මුදලක් පමණක් වැයකර රු.2,591,863 ක් වූ ඉතිරි මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත පියවා තිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් තුළ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මාර්ග ව්‍යාපෘති 20 ක් වෙනුවෙන් රු.37,971,168 ක ප්‍රතිපාදන මුදල් ලබා දී තිබුණද, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් හා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් රු.166,200,000 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණද, සත්‍ය ලෙස වියදම් දරා තිබුණේ රු.48,990,000 ක් මුදලක් වූ අතර, ඉතිරි රු.117,210,000 ක සියයට 71 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන ආපසු යවා තිබුණි.

(ආ) පිළියෙල කර තිබුණු කාර්යසාධන වාර්තාවේ 4 ඡේදයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව සංරචක 11 ක් යටතේ දක්වා තිබුණද, ක්‍රියාකාරී සැලැස්ම තුළ එවැනි සංරචක කිසිවක් දක්වා නොතිබූ අතර, සුළු වාරි මාර්ග ඉදිකිරීම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන්ව නොතිබුණි.

(ඇ) ග්‍රාමීයව ඉදිකළ යුතු සතිපොලවල්, අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීම් සංරචකය හා නිවාස සඳහා සූර්ය පැනල සවි කිරීමේ යන සංරචක දෙකෙහි අපේක්ෂිත නිමවුම් මට්ටම සියයට 49 කට අඩු මට්ටමේ පැවතුණ අතර, මෙම සංරචක ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබුණි. මෙහි වෙන්කළ ප්‍රතිපාදන හෝ වර්ෂය අවසානයේ නිමි ව්‍යාපෘති සංඛ්‍යාව හා වටිනාකම් දක්වා නොතිබුණි.

(ඈ) තවද ප්‍රවේශ මාර්ග ඉදිකිරීම හා ග්‍රාමීය ජල සැපයුම් යන සංරචක දෙකෙහි නිමි ප්‍රතිශතය සියයට 50- 75 ක් අතරද, ක්‍රීඩාපිටි ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය හා සමාජ සුභසාධන යන සංරචක 03 හි නිමි ප්‍රතිශතය සියයට 75-89 ක් අතරද, සනීපාරක්ෂක පහසුකම් සැපයීම, නිවාස සංවර්ධනය හා වෙනත් යන සංරචක තුනහි නිමි ප්‍රතිශතය සියයට 90-100 ත් අතර පැවතුණද, මෙම සංරචක කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවීම හා කාර්යසාධන දර්ශක නිමි ප්‍රතිශතය පිළියෙල කිරීම සඳහා නිමි ව්‍යාපෘති සංඛ්‍යාව කෙතෙක්ද යන්න හා ඒ සඳහා දරන ලද සත්‍ය වියදම් කොපමණද යන්න කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි.

3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

(අ) ව්‍යාපෘතියේ වත්කම් නිෂ්ක්‍රියව පැවතීම

පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ මුදුල්ල අමුණ හා කොටකිඹුලා කඩ අමුණ ඉදිකිරීම් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පවරා එයින් ඉතිරි වූ අයිතම් 94 කට අදාලව භාණ්ඩ ඒකක 2,506 ක් විගණන දිනය වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 317- ඕතොට දිවුල්ලැව වසමේ ප්‍රාදේශීය ලේකම්වරයාට අයත් ඉඩමක පුද්ගලයන් කිහිපදෙනෙකු අනවසරයෙන් පදිංචි වී සිටි අතර, මෙම ඉදිකිරීම් වර්ෂ ගණනාවක් පුරා පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූ අතර, මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ බදු ලබාදීම වැනි ක්‍රියාමාර්ගවලින් ආදායම් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටා ඇති ඉඩම ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා ගෙන ප්‍රාදේශීය ලේකම්වරයා වෙත භාරදී නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 07 ක ඉඩම් හෙක්ටයාර් 9,486 ක් ගොඩනැගිලි 29 ක් හා පාපැදියක් වර්ෂ 02 සිට වර්ෂ 30 ක පමණ කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ඈ) භාවිතා කළ හැකි මට්ටමේ පවතින ජංගම අලෙවිකුට් 05 ක් භාවිතයට නොගෙන නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ නිශ්කාර්යව පැවතුණි.

(ඉ) භාවිතයට නොගන්නා ලද දිග අඩි 10 පමණ වන ඇස්බැස්ටෝස් ශීට් 25 ක් ප්‍රයෝජනයට නොගෙන අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දීර්ඝ කාලයක් තිස්සේ ගොඩගසා තිබුණි.

(ඊ) ඉබ්බාගමුව හා නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ වර්ෂ 02 සිට 10 දක්වා කාලයක් ප්‍රයෝජනයට නොගන්නා ලද යතුරු පැදි 02 ක් නිශ්කාර්යව පැවතුණි.

(උ) සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ HA-8867 ට්‍රැක්ටරය හා බවුසර් රථය 2014 වර්ෂයේ සිටද, මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ අංක WP-RX 9367 හා WP-RY 1536 දරන ජල බවුසර් දෙකද දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන අව්වට වැස්සට නිරාවරණය වෙමින් දිරාපත්ව පැවතුණි.

(ඌ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති කුරුණෑගල නාගරික සීමාව තුළ පිහිටි රජය සතු ඉතා වටිනාකමැති දේපළ 26 ක් කුරුණෑගල මහානගර සභාවට පවරා දෙන ලෙස ඉල්ලා තිබූ අතර, ඒවා විධිමත් පැවරීමක් සිදුකර නොතිබුණි. මෙම දේපළවලින් බොහෝමයක් වාණිජ පරමාර්ථයෙන් පවරා ගැනීම සඳහා ඉල්ලා තිබූ අතර, මේවා දිගුකාලීන බදු පදනම මත ලබාදී රජයට ආදායමක් උපයාගත හැකිව තිබියදී, මෙසේ මහානගර සභාවට පැවරීමට කටයුතු කරමින් පැවතීම මතභේදයට තුඩුදෙන කරුණකි.

(එ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හකුරුකුටියාව කටුවාවේවත්ත නමැති පර්චස් 169.77 ක රජයේ ඉඩම අනවසර පදිංචිකරුවන් විසින් අල්ලාගෙන තිබුණ අතර, මෙම ඉඩමේ වසර ගණනාවක සිට පදිංචිව සිටී පුද්ගලයින් සඳහා නීත්‍යානුකූල අයිතියක් ලබාදී නොතිබියදී මෙම ඉඩමේ පවුල් 12 ක් පදිංචිව ඇතත්, කිසිදු බදු මුදලක් වසර ගණනාවක් තිස්සේ අයකරගෙන නොමැති අතර, අනවසර ඉදිකිරීම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඒ) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්කරව්ව ආයුවන්දම ග්‍රාමයේ රජයට අයත් කන්දක් සහිත ඉඩමක වසර ගණනාවක සිට විශාල වශයෙන් අනවසරයෙන් බොරළු කැණීම් සිදුකිරීම හේතුවෙන් විශාල පරිසර හානියක් සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් භූවිද්‍යා පතල් කැණීම් කාර්යාලයේ, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පරිසර අධිකාරිය වැනි ආයතනවල අනුමැතියකින් තොරව අනවසරයෙන් බොරළු කැපීම් සිදුකරන අතර, දීමනාපත්‍ර මඟින් පදිංචිකරුවන් කීපදෙනෙකු සඳහා මෙම ඉඩම ලබාදී තිබුණි. රජයට කිසිදු ප්‍රතිලාභයක් අත් නොවී බාහිර පාර්ශවයන් විසින් බොරළු විකිණීමෙන් විශාල ආදායමක් ලබාගන්නා අතර, මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පඩුවස්නුවර (බටහිර) හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික නිලධාරියෙකුට අදාලව ඇප මුදල් තැන්පත් කළ බැංකු පාස්පොත් ඔවුන් වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

3.5 පාඩු හා හානි

පඬුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මඳුල්ල අමුණ හා කොටකිඹුලාකඩ අමුණ ඉදිකිරීමෙන් පසු ඉතිරි වූ රු.52.000 ක් වටිනා සිමෙන්ති මිටි 56 ක් 2020 මැයි 01 දින ගබඩාව වෙත භාර දී තිබුණු අතර, විගණන දිනය 2022 පෙබරවාරි 03 වන දින භාවිතයට ගත නොහැකි ලෙස ගල්වී තිබීමෙන් පාඩු සිදුව තිබුණි.

3.6 අනාර්ථික ගනුදෙනු

ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් 2017,2018 හා 2019 වර්ෂවලදී ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු හා දෙවන අදියර සඳහා වෙන්කර තිබුණ රු.241,522,755 ක ප්‍රතිපාදනවලින් රු.175,423,465 ක් වන සියයට 73 ක ප්‍රතිශතයක් පමණක් වියදම් කර සියයට 27 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණ අතර, ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්ගේ හා ව්‍යාපාරයට සම්බන්ධ සාමාන්‍ය ජනතාවගේ මේ සම්බන්ධ දැනීමක් නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු වූ යටිතල පහසුකම් ජීවනෝපාය සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය අවම මට්ටමක පැවති අතර, සමස්ථයක් ලෙස ගත් කළ ව්‍යාපෘතිය අක්‍රිය මට්ටමේ පැවතුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2020 දෙසැම්බර් 21 දිනැති අංක HDM/SEVI/17/3 ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කාර්යාල පරිශ්‍රවල ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් ලබා ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක වන බහුකාර්යය සංවර්ධන දෙපාර්තමේන්තු සහායකයින් ඉදිරියේදී යෙදවීමට අපේක්ෂා කරන බව දක්වා ඇතත්, වර්ෂය අවසන් වන විටත් එම උපදෙස් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජූලි 07 දිනැති අංක.BD/GPS/130/9/14/MCII ලිපිය ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම යාම, සේවයෙන් පහ කිරීම වැනි අවස්ථාවල 2014/ 2015 අයවැය යෝජනා යටතේ යතුරු පැදි ලබාගෙන තිබේනම් නිලධාරියා ඒ සඳහා ගෙවා තිබෙන මුදල අඩුකර ඉතිරි මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බව දන්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක එවැනි හේතුමත සේවයේ නිරත නොවන නිලධාරීන් 10 දෙනෙකුගෙන් යතුරු පැදි සඳහා අදාල රු.1,159,360 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014/2015 අයවැය යෝජනා යටතේ යතුරු පැදි ලබාගත් නියමිත කාලය සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකු ගෙවීම් කිරීමට අපහසු බැවින් යතුරු පැදිය පවරා ගන්නා ලෙස දුනුම් දී තිබුණද, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ගම්පත්තුව කෝරලේ 1201-වැදණ්ඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දික්වැහැර ග්‍රාමයේ අංක 47/19/1 මු.පි.කු.1326 දරන පිඹුරෙහි අංක 54 දරන කොස්කැලය නමැති බිම් කැබැල්ල ප්‍රදාන පත්‍ර හිමිකරු විසින් පෞද්ගලික සන්නිවේදන කුළුණක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී සමාගමක් වෙත ලබාදී තිබුණ අතර, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2008 ජූලි 16 දිනැති අංක 2007/3(iii) චක්‍රලේඛය ප්‍රකාරව අදාල කොටස නැවත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරාගෙන නොතිබීම හේතුවෙන් හා අදාල සන්නිවේදන සමාගම සමඟ දීර්ඝ කාලීන බදුකරයකට එළඹ නොතිබීම හේතුවෙන් රු.1,015,000 ක ගණනය කළ අලාභයක් රජයට සිදුවී තිබුණි.

(ඉ) මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 68 න් 36 කට වන අලි තර්ජන පැවති අතර, පසුගිය වර්ෂ 3 කදී වන අලි හානි වෙනුවෙන් රු.1,980,725 ක් පමණ මුදලක් ජීවිත, දේපළ හා වගා හානි ලෙස ගෙවා තිබුණ අතර, විදුලි වැට සැකසීම්, ස්වාභාවික අලි වැට සකස් කිරීම් වැනි ස්ථිර විසඳුම් සකස් කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ඊ) ඉබ්බාගමුව, සහ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ රජයේ විවිධ සංවර්ධන යෝජනා සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී පිළිවෙලින් ඉඩම් කට්ටි 3,136 ක් හා 52 ක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වසර 01 සිට 49 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයින් 207 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ රු.41,217,889 ක විශ්‍රාම වැටුපෙන් තවදුරටත් රු.22,685,025 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි.

(ඌ) මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 06 දිනැති හා අංක 01/2019 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව සපිරිගමක් සංවර්ධන වැඩසටහනේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණද, නාරම්මල හා බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණු එම ඉදිකිරීම්වල ප්‍රමාද වීම් හේතුවෙන් අතැති බිල් ලෙස දක්නට ලැබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සිටියදීත් ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවා තිබුණද, මෙවැනි සංවර්ධන ව්‍යාපෘතිවලට ඔවුන්ගේ දායකත්වයක් ලබාදී නොතිබුණි.

(එ) සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක් සඳහා නිෂ්පාදන ගම්මාන ක්‍රියාත්මක කිරීමට ලබාදුන් මුළු ප්‍රතිපාදන මුදල වූ රු.65,214,952 ක මුදලින් ව්‍යාපෘති ඉටු නොකිරීම හේතුවෙන් රු.33,142,728 ක ප්‍රතිපාදන මුදලක් එනම් සියයට 51 ක මුදලක් ඉතිරිව පැවතුණි.

(ඒ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් මඟින් සම්පාදිත සම්පත් පැතිකඩ අනුව ප්‍රදේශයේ ජනතාව අතර, විදුලි රහිත නිවාස 1,020, ජල මුද්‍රිත වැසිකිලි රහිත 1,696 සහ තාවකාලික නිවාස 2,491 පැවතියදී සනීපාරක්ෂක පහසුකම් නොමැති නිවාස සඳහා වැසිකිලි පහසුකම් ඇති කිරීම සහ ස්ථීර නිවාස සඳහා විදුලි පහසුකම් ඇති කිරීම ආදිය සඳහා මුළු වියදමින් රු.641,050 ක් වන සියයට 3 ක් පමණක් වියදම් කර තිබුණි.

(ඔ) සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉහළ වල්පොල සිට වැවගෙදර දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රමිතිය අනුව ගල් කියුබ් 30 ක්ද, වැලි කියුබ් 17 ක්ද, සිමෙන්ති මිටි 610 ක්ද යෙදවිය යුතු වුවත්, සංවර්ධන නිලධාරීන් ලොග් පොත අනුව දක්වා තිබුනේ ගල් කියුබ් 01 ක්, වැලි කියුබ් 03 සිමෙන්ති මිටි 200 ක් පමණක් යෙදවූ බව නිරීක්ෂණය විය.

(ඕ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බක්මීගොල්ල කාමෙල්වත්ත කුලසිංහ මහතාගේ නිවස අසල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව සත්‍ය ද්‍රව්‍ය භාවිතයන් සම්බන්ධ විස්තර ලොග් පොතේ දක්වා නොතිබුණි.

(ක) සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් බිහිකිරීමේ වැඩසටහන යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් වෙත ලබාදුන් රු.166,653,664 ක ප්‍රතිපාදනවලින් රු.71,038,365 ක් වැයකර ඉතිරි ප්‍රතිපාදන රු.95,615,299 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ග) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මඟින් 2017 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක කුඩා කර්මාන්ත ඇහලුම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී තිබුණු රු.122,264,445 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ලබාදී තිබුණද, විගණන අවස්ථාව වන විටත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකව නොපැවති අතර, භාණ්ඩ හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

4. තිරසර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු 17 ක් හඳුනාගෙන තිබුණද, 7 වන අරමුණ වූ සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වසනීය තිරසර සහ නවීන බලශක්ති සැපයුම් තහවුරු කිරීම සඳහා වර්තමානයේ පවතින විදුලි අර්බුදයට පිළියමක් වූ නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශවීම යන අත්‍යවශ්‍ය අරමුණු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන්කර නොතිබීම හේතුවෙන් වර්ෂය අවසානයේ කාර්යසාධනය ශූන්‍ය අගයක්ව පැවතුණි.

4.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසර සංවර්ධන අරමුණු 17 ක් වර්ෂ 2030 දී සපුරාගන්නේ කෙසේදැයි ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර් ගතවී නොතිබීමත් රේඛීය අමාත්‍යාංශ හරහා ප්‍රතිපාදන ලබාගෙන මෙකී අරමුණු හා බද්ධ කරගැනීමේ අඩුපාඩු පැවතීමත් නිරීක්ෂණය වූ අතර, වාර්ෂිකව සපුරා ගන්නා ඉලක්ක පමණක් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රගතියට දක්වා තිබීමත් නිසා රාජ්‍ය මූල්‍ය ප්‍රමුඛතා අනුව සැකසූ මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව හා ඇස්තමේන්තු ගත සම්පත් සමඟ අයවැය ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ අයවැය වෙන් කිරීම් හා වියදම් පෙල ගැස්වීමක් නොහැකි අතර, කාර්යසාධනය මත පදනම් වූ අයවැය කරන ක්‍රමවේදයක් සිදුවී නොතිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හමන්ගල්ල හා තඹකන්ද ග්‍රාමී නිලධාරී වසම්වල කළුගල් හා බොරළු කැණීම් ස්ථාන 02 ක් සම්බන්ධයෙන් වසර ගණනාවක සිට මහජන පැමිණිලි හා විරෝධතා ලැබී තිබුණ අතර, පවතින මහජන ගැටලු සම්බන්ධයෙන් නිසි විසඳුමක් ලැබී නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
(i). ජ්‍යෙෂ්ඨ මට්ටම	136	122	14	-
(ii). තෘතියික මට්ටම	73	52	24	3
(iii). ද්විතියික මට්ටම	4,936	4,648	287	1
(iv). ප්‍රාථමික මට්ටම	292	262	28	2
එකතුව	5,437	5,084	353	6

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාරම්මල, ඉබ්බාගමුව, පඬුවස්නුවර (බටහිර) හා කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජේෂ්ඨ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුගේ හා තෘතියික මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කරවාගෙන නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති භාෂා පරිවර්තක නිලධාරීන් තිදෙනෙකු ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක සේවය කරනු ලබයි.

එම්.එස්.නයන කුමාර,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4.0 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	අංශය/සංරචකය	අපේක්ෂිත නිමවුමේ (%) ලෙස තත්‍ය නිමැවුම			
		0%-49%	50%-74%	75%-89%	100%-90%
1	ප්‍රවේශ මාර්ග (ජාතික/පළාත්/පාලන/ග්‍රාමීය මාර්ග)	-	✓	-	-
2	සනීපාරක්ෂ කපහසුකම්	-	-	-	✓
3	ක්‍රීඩා පිටි	-	-	✓	-
4	ග්‍රාමීය ආර්ථිකය (සතිපොළ/අලෙවි මධ්‍යස්ථානය/ස්වයං රැකියා)	✓	-	-	-
5	ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය	-	-	✓	-
6	සමාජ සුභ සාධනය (අධ්‍යාපන/සෞඛ්‍ය /ප්‍රජාශාලා)	-	-	✓	-
7	නිවාස සංවර්ධනය	-	-	-	✓
8	සුර්යය පැනල/විදුලිය (නිවාස ඒකක සඳහා)	✓	-	-	-
9	ග්‍රාමීය ජල සැපයුම්	-	✓	-	-
10	වෙනත්	-	-	-	✓

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

අරමුණු අංකය	අරමුණු	ඉලක්ක අංකය	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
					0%-49%	50%-74%	75%-100%
1	සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.1	2030 වන විට ලෝකයේ සියළුම ස්ථානවල වෙසෙන පුද්ගලයන්ගේ අන්ත දරිද්‍රතාව තුරන්කිරීම.වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්තදිළිදු කාණ්ඩයට අයත්වේ.	1.1.1	40		
		1.3	පහළමට්ටමේ අයද ඇතුලත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූසමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීමසහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත්ලෙස එමගින් ආවරණය වී තිබීම.	1.3.1		64.5	
		1.අ.	විශේෂයෙන් අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහසංවර්ධනය වෙමින් පවත්නා සියළුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාශය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩි දියුණුකරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබා දීමකැපීපෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම	1.අ.1			100
				1.අ.3			100
		1.ආ	දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලින් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදිජාතික,කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම	1.ආ.1			100

2	සාගින්නනැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2.1	2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙනසහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසරපුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම	2.1.1			94.61
		2.3	2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේගොවි පවුල් හා ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායීතාව සහ ආදායම ඉඩම්වලට ආරක්ෂාකාරීම සහ සමාන ලෙස ප්‍රවේශ වීමේඅවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන් ,දැනුම, මූල්‍ය සේවා, වෙළෙඳපොල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මඟින් දෙගුණ කිරීම	2.3.1			75.75
				2.3.2		69	
		2.4	2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීමතහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ කාළගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාළගුණික තත්ත්වයන්, නියහ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම	2.4.1		59.27	

		2.ඇ	සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැලැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොලවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම	2.ඇ.1		61.5	
3	නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	3.4	2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේක්‍රම මඟින් 1/3කින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම	3.4.1	39.45		
				3.4.2			100
		3.6	2030 වන විට මහාමාර්ගවල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාලවීම් සහ මරණ සංඛ්‍යාව අඩුවීම.	3.6.1			100
		3.9	2030 වන විට රසායනික වාතය ජලය හා පස දූෂණයවීමත්,අපිරිසිදු වීමත් නිසා ඇතිවන මරණ සහ රෝගි තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩුකිරීම	3.9.2		50	
4	පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.1	2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයේ සියලුම ගැහැනු ළමුන්හා පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රථමික සහ ද්විතීය අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.	4.1.1			100
		4.3	2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබාගතහැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනයද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම	4.3.1		55	
		4.4	2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයන් සඳහා තාක්ෂණික සහ වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබාසිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතුමට්ටමින් ඉහළ නැංවීම	4.4.1			100

		4.6	2030 වන විට සියළුම තරුණ තරුණීන්,සහ කාන්තා ,පිරිමි,වැඩිහිටි පුද්ගලයින්ගේ සැලකියයුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාවලබා සිටීම.	4.6.1	0		
5	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියළු කාන්තාවන් සහ ගැහැණුළමුන් සවිබල ගැන්වීම	5.1	කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොටසැලකීම් තුරන් කිරීම	5.1.1			100
6	සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	6.1	2030 වන විට සියලු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබාගැනීමට හැකි වීම	6.1.1			99.71
7	සියල්ලන් සඳහා දැරිය හැකි ,විශ්වසනීය,තිරසර සහ නවීන බල ශක්තිසැපයුම සහතික කිරීම	7.1	2030 වන විටසියළුදෙනාටම අඩු මිලකට ලබා ගතහැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම	7.1.1	0		
8	සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.1	ජාතිකතත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවමවශයෙන් වසරකට 7%ක දල ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම.	8.1.1			99.8
		8.5	2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයන් ද ඇතුළත්ව සියළුම කාන්තාවන් හා පිරිමින්සඳහා ඵලදායී සහ සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම	8.5.2			100
		8.8	කම්කරු අයිතිවාසිකම් ආරක්ෂාකරගැනීම,විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුළු සංක්‍රමණිකයන් සහ අවධානම් සහගත රැකියාවල නිරතවුවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේශම් සහගතසේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම	8.8.1			100

		8.ආ	2020 වන විට තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබාදීම සඳහා ජගත් මට්ටමින් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම හා අන්තර් ජාතික කම්කරු සංවිධානයේ ජගත්රැකියා සම්මුතිය ක්‍රියාවට නැංවීම	8.ආ.1			124.54
9	සවිමත්යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්න සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණයදිරි ගැන්වීම	9.1	ආර්ථික සංවර්ධනය හා මානව යහපැවැත්ම වෙනුවෙන් සියලුදෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය වියහැකි වීම අවධානයට ගෙන තලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	9.1.1			89.88
		9.3	විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩාපරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොල දාමයන්ට ඒකාබද්ධ කිරීම	9.3.1		53.71	
				9.3.2		66	
10	රටවල් තුළ හා ඒවා අතර අසමානතාවය අඩු කිරීම	10.2	2030 වන විට වයස ,ලිංගිකත්වය, ආබාධිත බව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම	10.2.1	46		
11	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	11.1	2030 වන විට සියළුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගත හැකි නිවාස සහමූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණුකිරීම	11.1.1		73.70	
		11.4	ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	11.4.1		52.38	

12	තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	12.2	2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමානාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිතකිරීම වෙත ලභා වීම	12.2.2			98.5
		12.8	2030 වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාටතිරසාර සංවර්ධනය හා ස්වභාධර්මය සමග සුසංයෝගයෙන් යුත් ජීවන රටාවන් ගතකිරීම පිළිබඳව දැනුවත් භාවයක් සහ ඊට අදාළ තොරතුරු ලැබී තිබීම තහවුරු කිරීම.	12.8.1 (ඈ)		50	
				12.8.1 (ඈ) 1	0		
13	දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මකවීම	13.1	සියලුමරටවල කාලගුණයසම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණදීමේ හැකියාව ශක්තිමත් කිරීම.	13.1.1		63.21	
15	භූගෝලීයපරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනයනැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම	15.2	2020 වන විට සියළුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වනවිනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්ත්වයට පත් කිරීම සහ ජගත් මට්ටමින් වනරෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම	15.2.1		70	
		15.3	2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියහය සහ ගංවතුර නිසා බලපෑමටලක්වූ ඉඩම්ද ඇතුළුව විනාශයට පත්වූ ඉඩම් සහ පස නැවත යථා තත්ත්වයට පත් කිරීම සහඉඩම් විනාශයට පත් නොවන ලෝකයක් ඇතිකර ගැනීම	15.3.1			91.25
		15.5	ස්වභාවික වාසභූමි විනාශ වීම අවම කිරීමට කඩිනම් සහ කැපී පෙනෙන ක්‍රියාමාර්ග ගැනීම,ජෛව විවිධත්වයට හානිවීම නැවැත්වීම සහ 2020 වන විට තර්ජනයට ලක්වූ ජීවී විශේෂයන් ආරක්ෂා කිරීම සහ වඳවියාම වැලැක්වීම.	15.5.1	33.3		
		15.9	2020 වන විට ජාතික සහ ප්‍රාදේශීය සැලැසුම්වලට සංවර්ධන ක්‍රියාවලියට දරිද්‍රතාව පිටුදැකීමේ ක්‍රමෝපායන්ට සහ ගිණුම්වලට පරිසර පද්ධතිය සහ ජීව විවිධත්වයේ වටිනාකම ඒකාබද්ධ කිරීම	15.9.1			81.92

15	භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනයකිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම	15.අ	තිරසර ලෙස වනාන්තර කළමනාකරණය සඳහා සියළුම මූලාශ්‍රවලින් සියළුම මට්ටම්වලට කැපී පෙනෙන ලෙස සම්පත් ලබාදීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවලට වන සංරක්ෂණය සහ නැවත වනවගා කිරීම ඇතුළත්ව කළමනාකරණ කටයුතු සඳහා ප්‍රමාණවත් දිරි ගැන්වීම් ලබා දීම.	15.අ.1			100
16	තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැඟීම	16.2	ළමුන් කෲර වධහිංසා කිරීම්වලට හා අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක්වීම අවසන් කිරීම	16.2.1			100
		16.3	සියලුමදෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකිවීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම	16.3.1		58.35	
		16.5	සියලුම ආකාරයේ අල්ලස සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම	16.5.1			100
		16.6	සියලු මට්ටම්වලදි ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිධභාවයෙන් යුත් ආයතන පිහිටුවීම	16.6.1			100
		16.6	සියළුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිධභාවයෙන් යුත් ආයතන පිහිටුවීම	16.6.2			165.88
17	ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය	17.8	2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු හා විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහවිශේෂයෙන් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණුකිරීම	17.8.1			95

05.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග

2021 වර්ෂය තුල ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති මගින් ඉහල මට්ටමේ ප්‍රගතියක් ලභාකර ගැනීමට හැකි වූ අතර එහිදී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රමාණවත් පරිදි වර්ෂය ආරම්භයේදී ප්‍රතිපාදන නිකුත් නොකිරීම හා අක්මුදල් ප්‍රමාණවත් පරිදි නියමිත කාලයේදී නොලැබීමහා කෝවිඩ් වසංගත තත්වය අභියෝග බවට පත්විය.

06. පරිච්ඡේදය -

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/	(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	136	122	14	
තෘතීයික	73	59	24	
ද්විතියික	4936	4648	287	
ප්‍රාථමික	292	262	28	
එකතුව	**5437**	**5084**	**353**	

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබූ ආකාරය.

ආයතන කාර්යසාධනයට බලපෑම් කරනු ලබන ආකාරයේ මානව සම්පත් හිඟයක් හෝ අතිරික්තයක් නැත. ද්විතීයික මට්ටමේ පුරප්පාඩු බහුතරයක් වියළි කලාපීය කාර්යාලවල පවතින නමුත්, ප්‍රශස්ත මානව සම්පත් කළමනාකරණය තුළින් උපරිම කාර්යසාධනය ළඟා කර ගෙන ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	පුහුණුව	සහභාගි වූසංඛ්‍යාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
1	ඵලදායිතාවය හා තත්ත්ව කව කළමනාකරණය	146	35.14		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
2	විනය කාර්යපටිපාටිය	27	20.50		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
3	වන සංරක්ෂණ පණත	58	35.07		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
4	ව්‍යාපෘති සැලසුම්කරණය	62	23.22		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
5	වැටුප් පරිවර්තනය	55	23.81		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
6	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් රාජකාරි	42	9.65		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
7	ඇස්තමේන්තු සකස් කිරීම	46	8.15		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
8	ජල ව්‍යාපෘති සැලසුම් සැලසුම් කිරීම	40	9.20		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
9	දුරකථන යෙදවුම්, අන්තර්ජාල භාවිතය, EGN ව්‍යාපෘති වලට අදාල පරිගණක යෙදවුම් භාවිතය	40	16.98		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම

10	කාර්මික නිලධාරින් සඳහා වාරිමාර්ග ඇස්තමේන්තු සකස් කිරීම	30	338.00		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
11	පෞද්ගලික ලිපිගොනු නඩත්තුව	65	11.34		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
12	කාර්යාල ක්‍රම සහ ලිපිගොනු නඩත්තුව	50	25.280		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
13	ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය	59	22.43		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
14	වැඩබිම් පරීක්ෂාව සහ ඇස්තමේන්තු පරීක්ෂාව	61	12.34		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
15	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	64	13.93		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
16	සුපිලිපන්න රාජ්‍ය නිලධාරියෙකු සතු ගුණාංග	59	10.60		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
17	සරප් රාජකාරි	40	11.29		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
18	ව්‍යාපෘති සැලසුම්කරණය	32	21.40		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
19	ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය	32	20.44		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
20	කාර්යාල කාර්ය සහායක ධාරිතා සංවර්ධනය	28	10.45		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම

21	රථවාහන නඩත්තුව හා කාර්මික දෝෂ හඳුනාගැනීම	37	8.10		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
22	සමථ මණ්ඩල කටයුතු පිළිබඳපුහුණු වැඩසටහන	25	9.95		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
23	ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙදින පුහුණුව	52	25.55		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
24	වැඩබිම් පරීක්ෂාව හා ඇස්තමේන්තු පරීක්ෂාව	57	13.45		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
25	ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය	58	22.90		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
26	ගැටුම් නිරාකරණයේ භාවිතා වන සමථකරණය	56	13.05		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
27	විශ්‍රාම වැටුප් සකස් කිරීම	59	13.00		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
28	වැටුප් පරිවර්තනය	66	25.77		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
29	අමුත්තන් සඳහා ආහාර පිළිගැන්වීමේ ක්‍රම	34	36.80		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
30	ආයතන සංග්‍රහයේ විධිවිධාන හා විනය	55	30.79		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
31	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින පුහුණුව	34	28.97		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම

32	කාර්ය පටිපාටික රීති	54	13.60		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
33	වැඩබිම් පරීක්ෂාව සහ ඇස්තමේන්තු පරීක්ෂාව	54	12.95		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
34	ආයතන සංග්‍රහයේ විධිවිධාන හා විනය	59	32.64		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
35	කාර්ය පටිපාටික රීති	53	12.95		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
36	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණුව සඳහා	15	71.79		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම
37	මූලිකපරිගණක හා Internet, Email Google පුහුණුව	20	12.80		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම
38	තාක්ෂණිකදැණුම භාවිතයෙන් ගොනු පරීශීලන පුහුණු වැඩ සටහන	20	12.35		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම
39	මූලික පරිගණක පුහුණුව - K.K.S.	12	5.74		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම
40	Computer Hardware පුහුණුව	18	12.45		දේශීය	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම

41	MS- Access Data Base පුහුණුව	36	25.75		**දේශීය**	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම
42	MS- Advance Access Data Base පුහුණුව	51	38.56		**දේශීය**	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම
43	Payroll පාඨමාලාව	20	37.35		**දේශීය**	නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම
		1981	1196.51			

★දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි රාජ්‍ය නිලධාරින් සඳහා සකස් කළ 2021 වාර්ෂික පුහුණු සැලැස්ම පදනම් කර ගනිමින් පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීමට කටයුතු කළ අතර, එකී පුහුණු වැඩසටහන් නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද බැවින් ඔවුන්ගේ කාර්යසාධනය,දැනුම, ආකල්ප, කුසලතා ප්‍රවර්ධනය කිරීමෙහිලා ඉවහල් කරගනු ලැබ ඇත.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේ වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**		
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ	
1.6	වෙනත්	අනුකූල වේ	
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම (මු.රෙ.445)**		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	

2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම(මු.රෙ135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	COVID-19 හේතුවෙන් කාර්යාල වල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි වීම	දිස්ත්‍රික් ,ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු මඟින් දැනුවත් කිරීම සහ පසු විපරම් කිරීම තුළින් කඩිනමින් පිළිතුරු ගෙන්වා ගැනීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019අනුව, අවම වශයෙන් විගණන හාකළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රෙල්ඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රෙල්ඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රාල්ඛ අංක 05/2016 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රෙල්ඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමණාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	පෙර වර්ෂවල අපහරණය කිරීමට කටයුතු කල නමුත් මෙතෙක් අපහරණ කටයුතු අවසන් නොවූ වාහන පැවතීම	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු. රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016. 12. 29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ටවලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සිමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය ,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව ,රැස් කළ ආදායමෙන් ඇපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම් , තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු	අනුකූල වේ		
	ලිඛිතව ලබා දී තිබීම			
16.3	20. 09. 2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ විකල්ප මාර්ග ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන, හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රාකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය.